PAFFREL

CMEV

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහ ලේකම් කාර්යාලය,
සරණ පාර,
රාජගිරිය.

2020-04-02

හිතවත් සභාපතිතුමනි,

<u>කොරෝනා වෛරසය මැඩලීමේ කාර්යයට සමගාමීව සිදුවන සහනාධාර බෙදීමේ ක්‍රියාවලිය තුළ පැනනැගී ඇති ගැටලු පිළිබඳව දැනුම් දීම</u>

පෙර කිසි කලෙකත් අප ශ්‍රී ලාංකිකයන් කිසිවෙක් මුහුණ නොදෙන ලද ආකාරයේ බිහිසුණු අර්බුදයක් අභියස සිටින අප කිසිදු භේදයකින් හෝ පසුබැසීමකින් තොරව එකිනෙකා හට සහය දැක්වීමේ තීරණාත්මක අවදියක් කරා ලඟා වී සිටින්නෙමු. මෙම ව්‍යසනකාරී වසංගතය පිටුදැකිය යුත්තේ සාමූහිකව වන අතර යම් යම් බිඳ වැටීම් පැවතියද, දැනටමත් රටක් ලෙස අපි සැවොම නිවැරදි ප්‍රවේශයක් අනුගමනය කරමින් සිටින බව අපගේ විශ්වාසයයි.

එහිලා තීරක සාධකයක්ව ඇත්තේ සහනයක් අවැසි අපගේ සහෝදර ජන ප්‍රජාව වෙත කඩිනමින් පහසුකම් සැලසීමයි. ඒ සඳහා දැනටමත් රජය මගින් සුවිශේෂී පියවර රාශියක් ගෙන ඇති බව ඉතා පැහැදිළිය. එහෙත් එකී කවර කාර්යයකදී වුවද අප සැලකිලිමත් විය යුතු කරුණක් ඇත. එනම් අප මේ පසුකරමින් සිටිනුයේ මැතිවරණ කාල සමයක් ය යන්නයි. පාර්ලිමේන්තු මහා මැතිවරණය කල් තබා ඇත්තේ වුවද ඒ සඳහා දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් මගින් භාරදෙන ලද නාම යෝජනා (මැතිවරණ කොමිෂන් සභාව මගින් අනුමත කරන ලද) තවමත් වලංගුය.

එවන් පසුබිමක පළාත් පාලන ආයතන සතු සම්පත් උපයෝගී කරගනිමින් සකසනු ලබන ආහාර හා වියලි ද්‍රව්‍ය පාර්සල් තමන් විසින් ලබා දෙන්නේය යන හැඟීම දනවන සේ ජනතාව අතර බෙදා හැරීමට බොහෝ අපේක්ෂකයන් පියවර ගෙන ඇති බවට වන පැමිණිලි දිනෙන් දින ලැබෙමින් පවතින පසුබිමක් නිර්මාණය වී ඇත. එපමණක් නොව රාජ්‍ය යාන්ත්‍රණය පොදුවේ ජනතාවට සහන සැලසීමට ගන්නා යම් යම් උත්සහයන්ද සමහර දේශපාලන පක්ෂ අපේක්ෂකයන්ගේ අනිසි සහභාගීත්වය තුළ අවදානමට පත්ව ඇත.

මෙවන් ජාතික ආපදාමය පසුබිමක සහනයක් අවැසි ජනතාවට පිහිටවීම කිසිසේත් අවතක්සේරු කිරීමට අප නොකැමැත්තෙමු. තවද එහි පවත්නා සංවේදීබව ද අපි මනාව වටහාගෙන සිටින්නෙමු. එසේ හෙයින් අපගේ


කාරුණික ඉල්ලීම වන්නේ මෙකී සහන සැලසීමේ සමස්ත ක්‍රියාවලිය අදාළ දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අධීක්ෂණය හා නායකත්වය යටතේ සිදුවිය යුතු බවයි.

සහෝදර ජනප්‍රජාව වෙත උපකාර කිරීමේ සැබෑ අවශ්‍යතාවෙන් යුත් කවර හෝ අපේක්ෂකයෙක් හෝ අපේක්ෂිකාවක් වෙත්ද ඔහු හෝ ඇය එවන් ආකාරයේ සහනාධාර ලබාදීමේ කවර හෝ ක්‍රමවේදයක් දියත් කල යුත්තේ මෙකී යාන්ත්‍රණය ඔස්සේ බව අවධාරණය කිරීමට කැමැත්තෙමු. ජනතාවට සහනයක් ලබාදීමේ යහපත් අරමුණින් යුත් කිසිවෙකුට මෙම යෝජනාවෙන් බැහැරව කටයුතු කිරීමේ හැකියාවක් ඇතැයි අපි කිසිසේත් නොසිතන්නෙමු.

ඒ අනුව මෙරටේ ක්‍රියාකාරී මැතිවරණ නිරීක්ෂණ සංවිධාන දෙකක් ලෙස අප මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමන් ඇතුළු සමස්ත කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටිනු ලබන්නේ කිසිදු දේශපාලන බැඳියාවකින් තොරව හා කිසිදු දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය නොවන ආකාරයට සහනාධාර බෙදීමේ ක්‍රියාවලිය සිදුවන්නේද යන්න පිලිබඳ විධිමත් පසුවිපරමක් සිදුකිරීමට වහා පියවර ගන්නා ලෙසයි.

තවද ඉහත සමස්ත යාන්ත්‍රණය දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ නිසි අධීක්ෂණයෙන් සිදුකිරීමට අවශ්‍ය මඟ පෙන්වීමක් සිදු කරන ලෙසද මැතිවරණ කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටීමට කැමැත්තෙමු!

ස්තුතියි



රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ
පැෆ්රල් සංවිධානය (PAFFREL)



මංජුල ගජනායක
ජාතික සම්බන්ධීකාරක
මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ
මධ්‍යස්ථානය (CMEV)

පිටපත්:

පී. බී. ජයසුන්දර මහතා, ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය, කොළඹ 01.

සමන් ශ්‍රී රත්නායක මහතා, මැතිවරණ කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා මැතිවරණ කොමිසම, සරණ මාවත රාජගිරිය.

උනන්දුවක් දක්වන දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හා මාධ්‍ය